# අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය

## උපදෙස් පත්‍රිකාව

## කථික තරග

1.1. මෙම තරගය සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ යන භාෂා පහෙන් අංශ හතර ම සඳහා පැවැත්වේ. එක් තරගකරුවෙකුට එක් භාෂා මාධ්‍යයකින් පමණක් සහභාගී විය හැකි ය.

1.2. තරග කොන්දේසි

1.2.1. පැහැදිලි නිරවද්‍ය උච්චාරණය, අවස්ථාවෝචිත අංග චලනය හා හඬ පාලනය ගැන අවධානය යොමු කළ යුතු ය.

1.2.2. සෑම තරගකරුවෙකුට ම විනාඩි 05ක පෙර සූදානමකට අවස්ථාව හිමිවන අතර කථාව ද විනාඩි 05කට සීමා විය යුතු ය.

1.2.3. තෝරාගනු ලබන මාතෘකාව යටතේ කථාව කළ යුතු ය.

1.2.4. ජාතික මට්ටම දක්වා පහත තේමා යටතේ මාතෘකා සැකසිය යුතු ය.

1. භික්ෂු අධ්‍යාපනය
2. ලංකා ඉතිහාසය
3. මුද්‍රිත හා විද්‍යුත් ජනමාධ්‍ය
4. පරිසරය
5. විද්‍යාව හා තාක්ෂණය
6. ශාසන ඉතිහාසය
7. ජාතික වීරවරු
8. පැරණි උරුමයන්
9. ගෝලීයකරණය
10. බෞද්ධ සාහිත්‍යය
11. සාහිත්‍යධරයන්

1.3. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | මාතෘකාවට අදාළ කරුණු | - 10 |
| 2. | පැහැදිලි නිවැරැදි උච්චාරණය හා හැඟීම් ප්‍රකාශනය | - 10 |
| 3. | තර්කානුකූල බව | - 05 |
| 4. | කරුණු තහවුරු කිරීම සඳහා අවස්ථාවෝචිතව සිදුකෙරෙන අංගචලනය | - 05 |
| 5. | කථා සන්දර්භයට අදාළ සිත්ගන්නා සුළු ඉදිරිපත් කිරීම | - 10 |
| 6. | නියමිත කාලයට සීමා කිරීම | - 10 |

| | |
|---|---|
| මුළු ලකුණු | - 50 |